**ශීර්ෂය 256 - ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

# 1 මූල්‍ය ප්‍රකාශන

## 1.1 මතය

ශීර්ෂය 256- ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 මැයි 28 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 ජූනි 07 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

ගම්පහ දිස්ත්රික් ලේකම් කාර්යාලයේ 2023 දෙසැම්බර් 31 දිනට මුල්ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුල්ය කාර්යසාධනය හා මුදල් ප්රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මුලධර්මවලට අනුකූලව සත්ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 මතය සඳහා පදනම

ශ්රී ලංකා විගණන ප්රමිතිවලට (ශ්රී.ලං.වි.ප්ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්ය ප්රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මුලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්ය ප්රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්රමාණාත්මක සාවද්ය ප්රකාශනයන්ගෙන් තොරව මූල්ය ප්රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්යවන අභ්යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්රකාරව ගම්පහ දිස්ත්රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්ය ප්රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්රකාරව ගම්පහ දිස්ත්රික් ලේකම් කාර්යාලයේ මූල්ය පාලනය සඳහා සඵලදායි අභ්යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු මාගේ වාර්තාවේ 2.5(අ) හා 5.1(ඇ)හි සඳහන් නිර්දේශ ක්‍රියාත්මකර නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී ඌන ඇස්තමේන්තු පිළියෙල කිරීම හේතුවෙන් වැය විෂයන් 10 ක් සඳහා මුදල් රෙගුලාසි 66 යටතේ රු.74,250,000ක ප්‍රතිපාදන සලසා ගෙන තිබූ අතර පරිපූරක ඇස්තමේන්තු යටතේ වැය විෂයන් 04ක් සඳහා රු.423,953,000ක අතිරේක ප්‍රතිපාදන සලසා ගෙන තිබුණි. | දීමනා සඳහා ඇස්තමේන්තු කළ මුදලින් කොටසක් වැටුප් ඇස්තමේන්තුව තුළ වැරදීමකින් ඇතුලත්ව තිබීම නිසා දීමනා සඳහා අතිරේක ප්‍රතිපාදන සලසාගෙන ඇත. ගොඩනැගිලි ඉදිකිරීම් හා වී මිලදී ගැනීමේ වැඩසටහන සඳහා පරිපූරක ඇස්තමේන්තු යටතේ ප්‍රතිපාදන සලසාගෙන ඇත. | හැකිතාක් දුරට නිවැරදිවත් සම්පූර්ණවත් ඇස්තමේන්තු පිළියෙල කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී වැය විෂයන් 02ක් සඳහා සලසා ගෙන තිබූ සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි. මෙම වැය විෂයන් 02 සඳහා 2022 වර්ෂයේදී ද වෙන්කර තිබූ රු.450,000ක ප්‍රතිපාදන මුදලම සම්පූර්ණයෙන්ම ඉතිරිව තිබියදී නැවත 2023 වර්ෂයේදී ප්‍රතිපාදන වෙන්කර තිබූ බව නිරීක්ෂණය විය. | 2023 වර්ෂයේ කපාහැරීම් සඳහා වෙන් කිරීම් සිදු කළද 1701 වැය විෂයය යටතේ කපාහැරීම් වාර්තා නොවීම නිසා මෙලෙස ප්‍රතිපාදනය ඉතිරි වී ඇත. | -එම- |
| (ඇ) | මියගිය, විශ්‍රාම ගිය, වැඩ තහනම් කළ හා සේවය හැරගිය නිලධාරීන්ගෙන් ආපදා ණය සහ වෙනත් ණය ලෙස 2023 දෙසැම්බර් 31 දිනට වර්ෂ 01 සිට වර්ෂ 20 දක්වා වූ කාල පරාසයක සිට පැවත එමින් තිබූ රු.3,555,331ක ණය ශේෂයක් පැවතුණි. | 2024 වර්ෂය තුල රු.1,359,860ක මුදලක් අයකරගෙන ඇති අතර තවදුරටත් රු.2,223,750ක මුදලක් අයකර ගැනීමට ඉතිරිව ඇත. එම ශේෂයද 2024 වර්ෂය අවසානයට පෙර අයකර ගැනීමට කටයුතු කරමි. | ණය ශේෂයන් අයකර ගතහැකි විකල්ප ක්‍රියාමාර්ග වලින් අයකර ගැනීමට කඩිනමින් කටයුතු කළයුතුය. |

### 2.2 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මියගිය බව දැනුම් දීමට ප්‍රමාදවීම, විශ්‍රාම වැටුප් චක්‍රලේඛවලට අනුගත නොවීම සහ වෙනත් හේතූන් මත ගම්පහ දිස්ත්‍රික්කය තුල ඇති ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13 මගින් 2023 දෙසැම්බර් 31 දිනට විශ්‍රාම වැටුප් ලබමින් සිටි විශ්‍රාමිකයින් 419 දෙනෙකු සඳහා එකතුව රු.40,518,538ක් වැඩිපුර ගෙවා තිබුණි. | 2024 නොවැම්බර් 30 දිනට පෙර අයකර ගැනීමට හෝ අදාල පාර්ශව දැනුවත්කර, අයකර ගැනීමට බලාපොරොත්තු වේ. | වැඩිපුර ගෙවීම් කඩිනමින් ආපසු අයකර ගැනීමට කටයුතු කළයුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | අමාත්‍යාංශ 20කින් , දෙපාර්තමේන්තු 25කින් සමාලෝචිත වර්ෂය අවසන් වන විට එකතුව රු.5,068,206,349ක ප්‍රතිපාදන ලැබී තිබුණු අතර රු.4,763,327,502ක් උපයෝජනය කර තිබූ අතර රු.304,878,847ක මුදලක් උපයෝජනය කර නොතිබුණි. | ආයතන 03 ක හැරුණු කොට අනෙකුත් ආයතනවල ප්‍රතිපාදන උපයෝජනය සතුටුදායක මට්ටමක පවත්වාගෙන ගිය බව දන්වමි. | ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු ලගාකරගත හැකි ආකාරයට ප්‍රතිපාදන උපයෝජනය කළ යුතුය. |

**2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම.**

| | නීති, රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | | | |
| **(i)** | VII පරිච්ඡේදය 12.2.3 වගන්තිය | වැඩ බැලීමේ පත්කිරීමක් කළ යුත්තේ නිත්‍ය පත්වීමක් කරනතෙක් තාවකාලික ප්‍රතිකර්මයක් වශයෙන් වුවද ගම්පහ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13තුල ග්‍රාම නිලධාරීන් 261 දෙනෙකු වසර 01 සිට වසර **10** දක්වා කාල පරාසයක් තුළ වැඩ බැලීම් කර තිබුණි. | පුරප්පාඩු වී ඇති තනතුරු සඳහා නිළධාරීන් අනුයුක්ත කරන ලෙස රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් වෙත දන්වා ඇති බව කාරුණිකව දන්වමි. | ආයතන සංග්‍රහයේ විධිවිධාන වලට අනුව කටයුතු කළ යුතුය. |
| **(ii)** | xxiv පරිච්ඡේදයේ 3.6 වගන්තිය | ආපදා ණය අයකර ගැනීමේදී අයකළ යුතු ණය වාරිකය මාසික වැටුපෙන් සියයට 10 ක් ලෙස ගණනය කලයුතු වුවද කටාන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරීන් 05 දෙනෙකුගේ ණය වාරිකය රු 3750ක් ලෙස අයකිරීම හේතුවෙන් මසකට රු7377ක් අඩුවෙන් අයකර තිබුණි. | ආයතන සංග්‍රහයේ වගන්ති අනුව ණය වාරික අයකරන ලෙසට නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත. | -එම- |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| | මුදල් රෙගුලාසි 1646 | අදාල මාසය අවසාන වී දින 15 ක් ඉක්ම වීමට පෙර මාසික ධාවන සාරාංශයක් පිළියෙල කර විගණකාධිපති වෙත ඉදිරිපත් කලයුතු වුවද මීරිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ප්‍රාදේශීය ලේකම්ට වෙන්කල කැබ් රථයේ මාසික ධාවන සටහන්පත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | අදාල කැබ් රථයේ මාසික ධාවන සටහන්පත් විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙසට නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත. | මුදල් රෙගුලාසි සංග්‍රහයේ විධිවිධාන වලට අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2014 ඔක්තෝබර් 16 දිනැති අංක 2014/04 දරන විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛය. | විශ්‍රාම වැටුප් ගෙවන විශ්‍රාමිකයන්ගේ විශ්‍රාමික ගොනුව අදාල ආයතනයෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට දින 90 ක් ඇතුලත නොයවන ලද අවස්ථාවලදී ගෙවීම් අත්හිටුවීම සහ ඒ බව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට දැණුම් දීම කළයුතු වුවද, විශ්‍රාම වැටුප් ගෙවීම් ආරම්භ වී දින 90 ක් ඇතුළත ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13 වෙත ලැබී නොමැති ගොනු 97ක් සම්බන්ධයෙන් එලෙස කටයුතු කර නොතිබුණි. | ගොනු අයත් කාර්යාල වෙත දැනුම් දී ගොනුව ගෙන්වා ගැනීමට ක්‍රියාකර අදාල මධ්‍යම දත්ත පද්ධතියට යාවත්කාලීන කිරීමට ක්‍රියාකරන බවත් මෙලෙස නොලැබී ඇති ගොනු අයත් විශ්‍රාමිකයින්ගේ වාර්ෂික ජීවිත සහතික ලබා ගැනීම තුලින් ඔවුන්ගේ ජීවත්වීම සනාථකර ඇති බවත් කාරුණිකව දන්වමි. | චක්‍රලේඛ විධිවිධාන වලට අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2006 අප්‍රේල් 25 දිනැති අංක 06/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය. | විශ්‍රාම වැටුප් ගොනු නොමැති වීම, විශ්‍රාම වැටුප් පරිමාණ ලබා නොදීම යනාදී විවිධ හේතු මත රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006ට අනුව විශ්‍රාම වැටුප් සංශෝධනය නොකළ ගොනු සංඛ්‍යාව 242 කි. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 6/2006 අනුව තාවකාලික ගොනු වන අතර ප්‍රමාණවත් තොරතුරු නොමැති බැවින් සංශෝධනය කිරීමට නොහැකි වී ඇති බව කාරුණිකව දන්වමි. | -එම- |

| | | | | |
|---|---|---|---|---|
| (ඉ) | 2016 ජනවාරි 12 දිනැති අංක 1/2010 දරන සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශයේ චක්‍රලේඛයෙහි 7.3 වගන්තිය | සෑම වර්ෂයකම දෙසැම්බර් 31 වන විට ප්‍රතිලාභීන් පිළිබඳ නැවත සමීක්ෂණයක් සිදු කළ යුතු වුවද වැඩිහිටි දීමනා ප්‍රතිලාභීන් පිළිබඳ අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වර්ෂ ගණනාවකින් සමීක්ෂණයක් සිදු කර නොතිබුණි. | වැඩිහිටි දීමනා කාඩ්පතක් වසර 03කට වරක් සංශෝධනය වන අතර සමීක්ෂණයක් සිදු කිරීම සඳහා වැඩිහිටි මහලේකම් කාර්යාලය විසින් ලබාදෙන උපදෙස් අනුව චක්‍රලේඛ ප්‍රකාරව සමීක්ෂණය සිදු කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | -එම- |
| (ඊ) | 2022 සැප්තැම්බර් 14 දිනැති අංක 02/2022 දරන ආරක්ෂක අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති චක්‍රලේඛය. | ගිනි අවි බලපත්‍ර අලුත් කිරීමේ දී ගිනි අවියේ අවශ්‍යතාවය තවදුරටත් පවතින බවට තහවුරු කර ගැනීම සඳහා අදාළ වගා ඉඩම්, සත්ත්ව ගොවිපළ,පැවතීම පිළිබඳ පත්තිරු හෝ සහතික කළ ඔප්පු පිටපත් ලබාගත යුතු වුවද කැලණිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය එලෙස කටයුතු කර නොතිබුණි. | 2024 වර්ෂයේ සිට ගිනි අවි බලපත්‍ර අලුත් කිරීමේදී ගිනි අවියේ අවශ්‍යතාවය තවදුරටත් පවතින බව තහවුරු කර ගෙන ගිනි අවි බලපත්‍ර අලුත් කිරීමට කටයුතු කරන ලෙස කැලණිය ප්‍රාදේශීය ලේකම් වෙත උපදෙස් ලබා දී ඇත. | -එම- |
| (උ) | 2021 මාර්තු 23 දිනැති අංක 5/2021දරන ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශ චක්‍රලේඛය. | නිල සෙවන කාර්යාල ඉදි කිරීමේ දී දිස්ත්‍රික් ලේකම් හෝ ප්‍රාදේශීය ලේකම් සතු රජයේ ඉඩමක එය ඉදි කල යුතු වුවද , දොම්පෙ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිල සෙවණ කාර්යාලය 03 ක් පෞද්ගලිකව පරිත්‍යාග කර ඇති ඉඩම්වල ඉදිකිරීම් කර ඇති නමුත් එකී ඉඩම් රජයට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශ චක්‍රලේඛ 5/2021 ප්‍රකාරව නිල සෙවණ කාර්යාල ඉදි කිරීමේදී දිස්ත්‍රික් ලේකම් හෝ ප්‍රාදේශීය ලේකම් සතු රජයේ ඉඩමක එය ඉදිකළ යුතු වුවද, කාර්යාල ඉදි කිරීමට සුදුසු ඉඩම් කොටස් නොමැති බැවින් පුද්ගලයන් විසින් කැමැත්තෙන් සිදු කරන ලද පරිත්‍යාග ඉඩම්වල නිල සෙවණ කාර්යාල ඉදි කර ඇත. | -එම- |

**2.4 අවිධිමත් ගනුදෙනු**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | 2016 ජනවාරි 12 දිනැති චක්‍රලේඛ අංක 1/2010 ප්‍රකාරව වැඩිහිටි දීමනා ගෙවිය යුත්තේ සෑම මසකම 15 දිනෙන් ආරම්භ වී වැඩ කරන දින 07ක් තුල තැපැල්/උප තැපැල් කාර්යාල හා දිවිනැගුම බැංකු මගින් පමණක් වුවද අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2022 වර්ෂයේ දෙසැම්බර් මස වැඩිහිටි දීමනා ප්‍රතිලාභීන් 503 ක් සඳහා හිමි රු.955,700ක වැඩිහිටි දීමනා ප්‍රතිලාභ ලබාගෙන නොතිබුණි. දෙසැම්බර් මස අවසානයේදී ඉතිරි වී තිබූ මෙම මුදල් රාජ්‍ය ආදායමට බැර කළ යුතු වුවත් එසේ නොපියවා එම මුදලින් රු.782,800ක් විධිමත් අනුමැතියක් රහිතව නැවත සරප් හරහා 2023 ජනවාරි මාසයේදී දීමනා ගෙවා තිබුණි. | සියලුම ප්‍රතිලාභීන් ඒ පිළිබඳ දැනුවත් වීමට තරම් කාලයක් නොමැති වීම හේතුවෙන් සහ තැපැල් කාර්යාල මගින් සීමිත දින ගණනක් ගෙවීම් කරන බැවින් විශාල පිරිසකට මුදල් ලබාගැනීමට නොහැකි වී තිබූ බැවින් නොගෙවූ මුදල් ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා ගෙවීම් සිදු කරන ලදී. ඉදිරියේදී මෙවැනි ගෙවීම් සඳහා චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කරන බව දන්වා සිටිමි. | චක්‍රලේඛ විධිවිධාන වලට අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2023 ජූලි වැඩිහිටි දීමනා පොරොත්තු ලේඛණය අනුව බෙම්මුල්ල තැපැල් කාර්යාලය මගින් ගෙවීමට අනුමත වී තිබූ වැඩිහිටි දීමනා රු.100,000ක මුදල තැපැල් කාර්යාලය හරහා නොගෙවා ග්‍රාම නිලධාරී මගින් වැඩිහිටි දීමනා ප්‍රතිලාභීන්හට ගෙවීම සිදුකර තිබුණි. | වැඩිහිටි පොරොත්තු ලේඛනය සඳහා හඳුනාගැනීමේ පත්‍රයක් නොමැතිව ගෙවීම් කල නොහැකි බව වාචිකව දන්වා බෙම්මුල්ල තැපැල් කාර්යාලයෙන් ගෙවීම් කිරීම ප්‍රතික්ෂේප කරන ලදී. අදාළ ප්‍රතිලාභය ලබාදීමේ අරමුණින් ප්‍රාදේශීය ලේකම්ගේ ලිඛිත අනුමැතිය ලබා අදාළ මුදල් ග්‍රාම නිලධාරීන් හරහා ගෙවීමට කටයුතු කර ඇත. | -එම- |

**2.5 වංචනික ස්වරූපයේ ගනුදෙනු**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | මහර ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ 2014 ජුලි 15 දින සිදු වු සේප්පුවේ මුදල් අතුරුදහන් වීම සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104(4) ප්‍රකාරව පැවති අවසන් පරීක්ෂණ වාර්තාව අනුව නිලධාරින් 04 දෙනෙකුගෙන් සමානව රු.270,561ක් බැගින් අයකර ගත යුතු බවට නිර්දේශ කර තිබු අතර 2020 සැප්තැම්බර් 22 දිනැති ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ ලිපියෙන් අදාල අය කිරීම සඳහා නිර්දේශ හා අනුමැතිය ද 2023 නොවැම්බර් 23 දිනැති රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්වරයාගේ | 2014 වර්ෂයේ මහර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සිදු වූ මුදල් වංචාව සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්ගෙන් අයවිය යුතු අලාභයෙන් රු.42,275ක මුදලක් අයවී ඇති අතර ඉතිරි මුදල් අයකර ගැනීම සඳහා අදාල නිලධාරින්ට හා ඔවුන් සේවය කරන ආයතන වලට නිරන්තර දැනුවත් කිරීම් සිදු කර ඇත. | අලාභය අයකිරීමට කටයුතු කළයුතු අතර අයකිරීමට කටයුතු නොකිරීම සම්බන්ධයෙන් වගකිවයුතු නිලධාරීන්ට එරෙහිව මුදල් රෙගුලාසි ප්‍රකාරව ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | අලාභය අයකරගැනීමේ නියෝගය පරිදි 2023 දෙසැම්බර් 31 දිනට පෙර රජයට සිදුවී ඇති අලාභය වන රු.1,082,245ක වංචාවට වගකිවයුතු පාර්ශවයන්ගෙන් සමසේ 2023 දෙසැම්බර් 31 දිනට පෙර අයකර ගතයුතු බවට නියෝගකර තිබුණද එදිනට රු.42,275ක් පමණක් අයවී තිබුණි. | | |
| (ආ) | මිනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත 2011 පෙබරවාරි 10 සිට 2013 ජූලි දක්වා කාලපරිච්ඡේදයේ ලැබුණු නොගෙවන ලද මහජනාධාර මුදල් රු.1,441,400ක් නිලධාරිනියක විසින් සාවද්‍ය පරිහරණයට අදාලව 104(4) වාර්තාව ප්‍රකාරව එම මුදල හා සියයට 2 ක අධිභාර මුදලක් අයකරන ලෙස ප්‍රධාන ලේකම්ගේ 2021 ජූලි 26 දිනැති ලිපියෙන් උපදෙස් දී තිබුණ ද 2023 නොවැම්බර් 08 දින වන විටත් අය කර තිබුණේ රු.84,840ක මුදලක් පමණි. | බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම්ගේ අංක CSWP/ADM/09-34/F1/101 හා 2021 ජූලි 26 දිනැති ලිපිය අනුව රු.1,470,268ක මුදල සමාන වාරික 03 කින් අය කළ යුතු බව එවකට සිටි දිස්ත්‍රික් ලේකම්ගේ අංක ගම්/දිලේ/5/මිනු/මුව හා 2021 අගෝස්තු 06 දිනැති ලිපියෙන් ප්‍රාදේශීය ලේකම් ජාඇල වෙත දන්වා ඇත. මෙම නිලධාරිනිය මේ වන විට විශ්‍රාම ගොස් ඇත. සම්පූර්ණ පාරිතෝෂිකයම හිලව් කළ විටද තවත් මුදලක් ඉතිරි වන බැවින් එම මුදල මාසිකව විශ්‍රාම වැටුපෙන් රු.20,000ක් බැගින් අයකිරීමට විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් වෙතින් අනුමැතිය ඉල්ලීමට ජාඇල ප්‍රාදේශීය ලේකම් විසින් කටයුතු කර තිබුණි. එහෙත් 2024 පෙබරවාරි 09 දින ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පැවති දිස්ත්‍රික් විගණන කමිටු රැස්වීමේදී එළැඹි තීරණයකට අනුව විශ්‍රාම වැටුප හිමිගැන්වීමට නම් මුදල් වංචාවේ මුළු අලාභය ගෙවීමට විශ්‍රාමිකයා වෙත දන්වන ලෙස තීරණය විය. ඒ අනුව ඉදිරි කටයුතු සිදු කරනු ලැබේ. | බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම්ගේ අංක WP/ADM/09-34/F1/101 හා 2021 ජූලි 26 දිනැති ලිපිය අනුව රු.1,470,268ක මුදල සමාන වාරික් 03 කින් අයකිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | ගම්පහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් විශ්‍රාම වැටුප් ලබාගත් නිලධාරිනියගේ විශ්‍රාම වැටුප හා ඇයට හිමි වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප එම විශ්‍රාමිකයා මිය යාමෙන් පසු වසර 05 ක් පමණ කාලයක් සඳහා රු.2,696,304ක් ගෙවා ඇති බව නිරීක්ෂණය වී තිබුණි. විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 09/2014 මගින් ජීවිත සහතික ලබා නොදෙන විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප් තාවකාලිකව නතර කිරීමට කටයුතු නොකිරීම මත විශ්‍රාම ප්‍රතිලාභියා විසින් ජීවත් වීමේ සහතික | වැඩිපුර ගෙවීම හඳුනාගත් විගස ගෙවීම් අත්හිටුවීමටත් වැඩිපුර ගෙවූ රු.2,696,303ක් වූ මුදලින් රු.250,000ක් අයකර ගැනීමට කටයුතු කර ඇති අතර මේ වන විට අධිකරණ නඩුවක් විභාග වෙමින් පවතී. | මුදල් ලබාගත් පුද්ගලයින්ගෙන් අයකරගැනීමට කටයුතු කළ යුතුය. |

ලබා දී නොතිබිය දී 2013 සිට 2016 දක්වා වූ වසර වලදී විශ්‍රාම වැටුප් අවිධිමත් ලෙස ගෙවා තිබුණි.

**2.6 තැන්පත් ශේෂයන්**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මුදල් රෙගුලාසි 570 සහ 571 ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පොදුතැන්පත් ගිණුම් 03ක රු.180,353,859ක කල් ඉකුත් වූ ශේෂ පැවතිය ද එම ශේෂයන් මුදල් රෙගුලාසි ප්‍රකාරව රජයේ ආදායමට ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි. | වන්දි ගෙවීම් නිරවුල් කිරීම සඳහා විශේෂ වැඩපිළිවෙලක් යොදා ඇති අතර අධිවේගී මාර්ග සඳහා අත්පත් කර ගැනීම් යටතේ වන්දි මුදල් ප්‍රමාණවත් නොවීම නිසා ලබා නොගත් වන්දි මුදල් වැඩි ප්‍රමාණයක් මෙම මුදල නියෝජනය වේ. කෙසේ වෙතත් මෙම තැන්පතු ශේෂ 2024 වර්ෂය තුල හැකිතාක් නිරවුල් කිරීමට උපදෙස් ලබා දී ඇත. | මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කල යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන 2021 ව්‍යාපෘතිය යටතේ මීනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ යාගොඩමුල්ල උතුර ග්‍රාම නිලධාරී වසමේ රස කැවිලි ආශ්‍රිත නිෂ්පාදන ගම්මාන ව්‍යාපෘතිය යටතේ ප්‍රතිලාභීන් 14 දෙනෙකුට ලබා දී තිබූ රු.1,015,380ක උපකරණ භාවිතයෙන් තොරව නිශ්කාර්යව පැවතුණි. | කර්මාන්තයේ දැනට නියැලෙන අයට උපකරණ ලබා දීමට කටයුතු කර ඇති අතර වෙනත් සුදුසු ප්‍රතිලාභියෙකු වෙත භාණ්ඩ යැවීම සඳහා තොරතුරු ලබාගනිමින් සිටින බව. | ව්‍යාපෘතියේ අරමුණු ඉටුකරගැනීම සඳහා ලබාදුන් උපකරණ ඵලදායීව යොදාගත යුතුය. |
| (ආ) | මීරිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ රු.8,202,635ක් වියදම් කර ඉදිකර තිබූ සේවා පියස් 10ක් අඩක් නිමකර භාවිතා නොකර නිශ්කාර්යව පැවතුණි. | සියලුම සේවා පියස් හා නිල සෙවන කාර්යාලවල අඩුපාඩු සම්පූර්ණ කිරීම සඳහා ඇස්තමේන්තු සකස් කර ස්වදේශ කටයුතු අමාත්‍යාංශය වෙත යොමු කර ඇති අතර, අදාල ඇස්තමේන්තු 2024 වර්ෂයේ අයවැය යෝජනා වෙත ඇතුළත් කර ඇති බව එම අමාත්‍යාංශය දන්වා ඇති බව කාරුණිකව දන්වා සිටිමි. | ඉදිකිරීම් නිමකර ඉඩම ඵලදායී කාර්යක් සඳහා යොදාගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩ සටහන යටතේ පේෂකර්මාන්ත ගම්මාන ව්‍යාපෘතිය මගින් ප්‍රතිලාභීන් 12දෙනෙකු හට ලබාදුන් රු.840,000ක් වටිනා උපකරණ භාවිතයට නොගෙන නිශ්කාර්යව පැවතුණි. | ප්‍රතිලාභින් 7දෙනෙකු සක්‍රීය මට්ටමට පැමිණ ඇත. භාවිතයට නොගන්නා ප්‍රතිලාභින්ගේ උපකරණ වෙනත් සුදුසු ප්‍රතිලාභියෙකුට පවරා දීම සඳහා කටයුතු කිරීමට නියමිතය. | ව්‍යාපෘතියේ අරමුණු ඉටුකරගැනීම සඳහා ලබාදුන් උපකරණ ඵලදායීව යොදාගත යුතුය. |
| (ඇ) | දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පේෂකර්මාන්ත ව්‍යාපෘතිය යටතේ රු.100,000ක් බැගින් රජයේ දායකත්වය මත ඉදිකර තිබූ වැඩ මඩු 08 ක් 2023 ඔක්තෝබර් මාසය වන විටත් වසා දමා නිශ්කාර්යව පැවතුණි. | සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන ගිවිසුමේ 3.4 වගන්තියට අනුව භාවිත නොකරනු ලබන ප්‍රතිලාභීන් වෙත ලබා දී ඇති රු.100,000ක මුදල ආපසු අයකර ගැනීමට කටයුතු කරන බවට දැනුම් දෙමින් සිහි කැඳවීම් ලිපි යවා ඇත . | -එම- |
| (ඉ) | සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන-2021 බියගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ක්‍රියාත්මක කර තිබූ රු.7,437,250ක පූජා භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපෘතිය සඳහා ප්‍රතිලාභීන් 13දෙනෙකු වෙත ලබාදුන් රු.139,000ක ඉටිපන්දම් අච්චු භාවිතයට ගෙන නොතිබුණි. | සෞභාග්‍යා පූජා භාණ්ඩ නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ ඉටිපන්දම් නිෂ්පාදනය සඳහා උපකරණ ලබාදුන් ප්‍රතිලාභීන් හට පැරෆින් ඉටි ලබාගැනීමේ නොහැකියාව මත ඉටිපන්දම් නිෂ්පාදනය නතර වී ඇත. | භාවිතයට නොගන්නා උපකරණ භාවිතයට ගනිමින් ව්‍යාපෘතියේ අරමුණු ඉටුකරගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.2 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන ව්‍යාපෘතිය යටතේ-2021 වර්ෂයේ දී ගම්පහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් මාකේවිට ප්‍රදේශයේ රු.1,875,525ක් වියදම් කර ඉදිකර තිබූ අලෙවි මධ්‍යස්ථාන 06 ක් සඳහා ඉදිකළ ගොඩනැගිල්ල හා රු.150,188ක් වැයකර උපකරණ තබා ගැනීමට සහ පොල්ලෙලි කැපීම සඳහා භාවිතයට ගැනීමට ඉදිකල ගොඩනැගිල්ල සුදුසු මට්ටමට වැඩ අවසන් කර නොතිබු බැවින් වැයකළ මුදලට මෙතෙක් ප්‍රතිලාභ ලැබී නොතිබුණි. | 2024 වර්ෂයේ විමධ්‍යගත ප්‍රතිපාදනයක් ලෙස රු.1,500,000ක් වෙන් කර ගැනීමට හැකිවු අතර , එම ගොඩනැගිල්ලට අදාල ඉදි කිරීම් කටයුතු ආරම්භ කර ඇත. | ගිවිසුම්ගත කාලය තුළ ව්‍යාපෘතිය නිමකිරීමට කටයුතු කළයුතු බව. |

## 3.3 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 වර්ෂයේ ගම සමග පිළිසඳරක් වැඩසටහන යටතේ දොම්පේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු.19,880,000ක මුදලක් වෙනුවෙන් අනුමත ව්‍යාපෘති 19 ක් ක්‍රියාත්මක කර රු.8,465,314ක වියදමක් දරා ව්‍යාපෘති අතරමඟ නවතාදමා තිබූ අතර දරන ලද වියදම නිශ්කාර්ය වියදමක් බවට පත්වී තිබුණි. | ඉදිරි වර්ෂයේදී ව්‍යාපෘති හඳුනාගැනීමේදී අතරමග නතරකල ව්‍යාපෘති සඳහා ප්‍රමුඛතාවය ලබාදී එම ව්‍යාපෘතිවල වැඩ අවසන් කිරීමට කටයුතු කිරීම. | ගිවිසුම්ගත කාලය තුළ ව්‍යාපෘතිය නිමකිරීමට කටයුතු කළයුතු බව. |
| (ආ) | දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කොස්ගොඩමුල්ල ග්‍රාමයේ ප්‍රජාශාලාවට අලුතින් කොටසක් එක්කර බහුකාර්ය ගොඩනැගිල්ලක් ලෙස සංවර්ධනය කිරීමේ කටයුතු රු.1,200,000ක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන මත 2022 මාර්තු 10 දින ආරම්භ කර රු.401,229ක වියදමක් දැරීමෙන් පසු ඉදිකිරීම් අතරමඟ නවතා දමා තිබුණි. | විමධ්‍යගත අයවැය වැඩසටහන් 2024 යටතේ රු.500,000ක මුදලක් වැඩ අවසන් කිරීම සඳහා අනුමත වී ඇත. | -එම- |
| (ඇ) | දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යලයේ 95A-කළුවාරිප්පුව උතුර ප්‍රජා ශාලාවට කොටසක් එකතු කර සේවා පියසක් ලෙස සංවර්ධනය කිරීමේ කටයුතු රු.1,200,000ක ඇස්තමේන්තුවක් මත 2022 පෙබරවාරි 03 දින ආරම්භ කර රු.298,958ක වියදමක් දැරීමෙන් පසු අතරමග නවතා දමා තිබුණි. | පසුව ව්‍යාපෘතියේ ඉතිරි කොටස සංවර්ධනය කිරීම සඳහා විමධ්‍යගත අයවැය වැඩසටහන 2024 යටතේ රු.500,000ක මුදලක් අනුමත වී ඇත. | -එම- |
| (ඈ) | වත්තල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ හොරපේ ශ්‍රී සුදර්ශනාරාම විහාරස්ථානයට අනුබද්ධව 2017 වර්ෂයේ දී ප්‍රාදේශීය යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන් යටතේ ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශයෙන් ලද රු.5,000,000ක ප්‍රතිපාදන වලින් රු.4,125,198ක් වැය කර ඉදිකර තිබූ බහුකාර්යය ගොඩනැගිල්ලට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් සනීපාරක්ෂක පද්ධතියක් නොමැතිවීම සහ විදුලිය හා ජල සැපයුම් ලබාගෙන නොතිබීම හේතුවෙන් මෙම ගොඩනැගිල්ල නිශ්කාර්යව පැවතුණි. | සනීපාරක්ෂක පහසුකම් නොමැති වීම හා ප්‍රධාන දොර සවිකර නොමැති බැවින් දැනට භාවිතයට නොගනී. ඉදිරියේදී ප්‍රතිපාදන ලබාගෙන අදාල අඩුපාඩු සම්පූර්ණ කිරීමට බලාපොරොත්තු වේ. | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඉ) | කටාන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන යටිතල පහසුකම් වැඩසටහන යටතේ මැහුම් කර්මාන්තයේ නියැලෙන ප්‍රතිලාභීන්ට තම නිෂ්පාදන අලෙවි කිරීම, පොළ පැවැත්වීම, පුහුණු පාඨමාලා පැවැත්වීම සඳහා උතුරු උදම්මිට ග්‍රාම නිලධාරී වසමේ රු.2,903,497ක් වැය කර ඉදිකර තිබූ ප්‍රජාශාලා ගොඩනැගිල්ල ඉදිකිරීමේ වැඩකටයුතු අවසන් කර ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු ඉටුකරගැනීම සඳහා යොදාගෙන නොතිබුණි. | 2022 අප්‍රේල් 26 දින නිකුත් කරන ලද ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022 ට අනුව ව්‍යාපෘති සිදු කිරීමට නොහැකි විය. 2024 වර්ෂය තුල අදාල ප්‍රතිපාදන ලබාගෙන ඉදිරි කටයුතු සිදුකිරීමට බලාපොරොත්තු වේ. | ව්‍යාපෘතියේ අරමුණු ඉටුකරගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | වත්තල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නුගපේ තොටුපළ පාර අසළ පිහිටි සේවා පියස බස්නාහිර පළාත් ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශය මඟින් ලැබූ රු.500,000ක ප්‍රතිපාදන මත රු.400,000ක වියදමක් දරා ප්‍රධාන කොන්ක්‍රීට් කණු ඉදිකර ඇති නමුත් බිත්ති බැද ඉදිකිරීම අවසන් කිරීමට කටයුතු නොකිරීමෙන් වැයකරන ලද මුදලද නිශ්කාර්ය වියදමක් බවට පත්ව තිබුණි. | 2024 වර්ෂය තුල ප්‍රතිපාදන ලබාගෙන අදාල අඩුපාඩු සම්පූර්ණ කිරීමට බලාපොරොත්තු වේ. | ව්‍යාපෘතිය නිමකිරීමට කටයුතු කළයුතු බව. |
| (උ) | ජා-ඇල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ නිෂ්පාදන ගම්මාන 03ක් ක්‍රියාත්මක වී තිබුණි. එම ව්‍යාපෘති සඳහා වෙන්කළ මුළු ප්‍රතිපාදනය රු.41,759,385ක් වූ අතර එයින් රු.22,938,385ක් පමණක් වැය කර තිබූ අතර නිෂ්පාදන ගම්මානයේ ප්‍රතිලාභීන් 10 දෙනෙකු ආදායම් උපයන තත්වයට පත්වී නොතිබුණි. බීජ හා රෝපන ද්‍රව්‍ය නිෂ්පාදන ගම්මාන ව්‍යාපෘතිය සඳහා උපකරණ ලබාදුන් ප්‍රතිලාභීන් 10 දෙනෙකු ද, බිම්මල් නිෂ්පාදන ගම්මාන ව්‍යාපෘතිය සඳහා උපකරණ ලබාදුන් ප්‍රතිලාභීන් 10 දෙනෙකු ද, විසිතුරු මත්ස්‍ය වගාව සඳහා උපකරණ ලබාදුන් ප්‍රතිලාභීන් 11 දෙනෙකු ද, ලබාදුන් උපකරණ භාවිතා නොකරන බව නිරීක්ෂණය විය. | ප්‍රතිලාභීන් 26 දෙනෙකු හැර ඉතිරි 139 දෙනෙකු මෙම වැඩසටහනේ නිරතව සිටී. | ලබාදුන් උපකරණ ඵලදායී ලෙස යොදා ගනිමින් ව්‍යාපෘතියේ අරමුණු ඉටුකරගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඌ) | මහර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ බටහේන පාර බැංකු වත්ත ප්‍රජාශාලාව රු.442,700ක වියදමක් දරා 2018 වර්ෂයේ පාදම හා කණු කොන්ක්‍රීට් කර බිත්ති අඩි 4ක් පමණ බැඳ ව්‍යාපෘතියේ කටයුතු සම්පූර්ණ කිරීමකින් තොරව අතහැර දමා තිබුණි. | ව්‍යාපෘතිය සම්පූර්ණයෙන්ම නිම කිරීම සඳහා අනුමත ප්‍රතිපාදන මුදල ප්‍රමාණවත් නොවුන ද අදාල ව්‍යාපෘතිවලට අනුමත ප්‍රතිපාදන මුදල යටතේ ඇස්තමේන්තුගත වැඩ කොටස් නිම කර ඇත. | ඉදිකිරීම් අවසන් කර ඵලදායී කාර්යකට යොදාගත යුතු බව. |
| (එ) | මහර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සපිරිගමක් ව්‍යාපෘතිය යටතේ ඌරුවල බටහිර කෘෂි උපකරණ ගබඩා සංකීර්ණයේ රු.481,086 ක් වියදම් කර 2020 වර්ෂයේ ඉදිකල ගොඩනැගිල්ලේ ඉහල මහල බිත්ති බැද කපරාදු කිරීම,පඩිපෙළ සඳහා අත්වැටක් සැපයීම,වැනි කාර්ය ඉටුනොකිරීම නිසා අපේක්ෂිත අරමුණට යොදාගැනීමට නොහැකි වී තිබුණි. | ව්‍යාපෘතිය සම්පූර්ණයෙන්ම නිම කිරීම සඳහා අනුමත ප්‍රතිපාදන මුදල ප්‍රමාණවත් නොමැත.ව්‍යාපෘතිය සඳහා අනුමත ප්‍රතිපාදන මුදල යටතේ ඇස්මේන්තුගත වැඩ කොටස් නිම කර ඇත. අදාල වැඩසටහන ඒම වර්ෂයෙන්ම නිම වූ අතර වැඩ අවසන් නොකළ කොටස් සඳහා ප්‍රතිපාදන වෙන් කිරිමක් ද සිදු නොවුණි. | -එම- |
| (ඒ) | මහර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නාරංවල ප්‍රජාශාලාවේ දෙමහල් ගොඩනැගිල්ල ඉදිකිරීමේ ව්‍යාපෘතිය 2015 වර්ෂයේ ආරම්භකර රු.923,000 මුදලක් වැයකර තිබුණද, බිත්ති කපරාදු කිරීම ,බිම සැකසීම, ජනෙල් දැමීම,පඩිපෙළට වැටක් සැකසීම වැනි කාර්යයන් ඉටුකිරීමට නොහැකි වීම නිසා ප්‍රජාශාලාවේ ඉදිකිරීම් නිමකර පරිහරණයට ගැනීමට නොහැකි වී තිබුණි. | 2024 වර්ෂය තුල අදාල ප්‍රතිපාදන සලසාගෙන අඩුපාඩු සම්පූර්ණ කිරීමට බලාපොරොත්තු වේ. | -එම- |
| (ඔ) | මහර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කිරිකිත්ත නැගෙනහිර සේවා පියසක් සඳහා කාමර 03 ක් ඉදිකිරීම සඳහා 2022 වර්ෂයේ රු.290,478 ක් වියදමක් දරා ඇතත් ගොඩනැගිල්ලේ ජනෙල් දොරවල් දමා භාවිතයට ගතහැකි තත්වයට පත්කර නොතිබුණි. | අදාල ව්‍යාපෘතිය සඳහා අනුමත ප්‍රතිපාදන මුදල යටතේ ඇස්තමේන්තුගත වැඩ කොටස් නිම කර ඇත. | -එම- |
| (ඕ) | ගම සමග පිළිසඳරක් 2022 වැඩසටහන යටතේ අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මිලියන 03 ව්‍යාපෘති සඳහා රු.5,108,252 ක් වියදම් කර ව්‍යාපෘති 14 ක් ආරම්භ කර ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු ඉටුකරගැනීමකින් තොරව අතරමග නතරකර තිබුණි. | පළමු කාර්තුවේ වෙන්වූ මුදලින් ව්‍යාපෘති 14 සිදුකල අතර ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවූ නිසා ඉතිරි කොටස් සිදු කරගත නොහැකි විය. අවශ්‍ය ප්‍රතිපාදන ලබාගෙන ඉතිරි කොටස් සිදු කිරීමට බලාපොරොත්තු වේ. | ගිවිසුම් කාලය තුළ ව්‍යාපෘති නිම කිරීමට කටයුතු කලයුතු බව. |

| | | | |
|---|---|---|---|
| (ක) | ගම සමග පිළිසඳරක් 2022 යටතේ අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය 320 මංගලතිරිය ග්‍රාම නිලධාරී වසමේ බහු කාර්යය සේවා පියස ගොඩනැගිල්ලේ පළමු අදියර යටතේ වැඩ නිම කිරීම වෙනුවෙන් වෙන් වී තිබූ රු.700,000 න් රු.534,593 වියදම් කර අත්තිවාරම හා කොන්ක්‍රීට් කණු 10 ක් පමණක් ඉදිකර සේවා පියස ඉදිකිරීම නවතා දමා තිබුණි. | ව්‍යාපෘතියේ ඇස්තමේන්තු ගත මුදල රු. 700, 000 කි. මුල් කාර්තුවේ නිම කළ වැඩ ප්‍රමාණය වන අත්තිවාරම හා කොන්ක්‍රීට් කණු 10 සඳහා රු. 534,593ක් ගෙවා ඇත. ඉතිරි වැඩ දෙවන කාර්තුවේ නිම කළ යුතුව තිබූ නමුත් ඒ සඳහා මුදල් වෙන් කිරීමක් සිදු නොවුනි. | ගිවිසුම් කාලය තුළ ව්‍යාපෘතිය නිම කිරීමට කටයුතු කලයුතු බව.නව ව්‍යාපෘති හදුනාගැනීමේදී මෙම ව්‍යාපෘතිය සඳහා ප්‍රමුඛතාවයක් ලබාදිය යුතු බව. |
| (ග) | ගම සමග පිළිසඳරක් 2022 යටතේ අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය 367, නාගොඩ ග්‍රාම නිලධාරී වසමේ ක්‍රීඩා පිට්ටනිය අසල ඉඩමේ බහුකාර්යය ගොඩනැගිල්ල ඉදිකිරීම වෙනුවෙන් වෙන් කර තිබූ රු.1,200,000 න් රු.336,821ක් වියදම් කර කොන්ක්‍රීට් කණු 10 ක් පමණක් ඉදිකර අතරමග නවතා දමා තිබුණි. | ව්‍යාපෘතියේ වටිනාකම රු. 1,200,000ක් විය. නිම කළ වැඩ කොටස් වන කොන්ක්‍රීට් කණු 10 ඉදි කිරීම සඳහා රු. 336, 821ක මුදලක් ගෙවා ඇත. දෙවන කාර්තුවේ මුදල් වෙන් නොකිරීම නිසා ඉතිරි වැඩ අවසන් කිරීමට නොහැකිව ඇති බව දන්වමි. | ගිවිසුම් කාලය තුළ ව්‍යාපෘතිය නිම කිරීමට කටයුතු කලයුතු බව. |
| (ච) | සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන 2021 යටතේ අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 246 පරණ වේයන්ගොඩ ග්‍රාම නිළධාරී වසමේ පරණ වේයන්ගොඩ මේජර් කේ.ටී. කරුණාරත්න මාර්ගයේ අබලන් වූ බෝක්කුව පිළිසකර කර අවශ්‍යා ස්ථානවල පැති බැම් යොදා මාර්ගය ආරම්භයේ සිට පන්සල දක්වා කාපට් කර සංවර්ධනය කිරීමට රු.2,745,344 ක මුදලක් වැය කර අදාල ඉදිකිරීම් කර තිබුණ ද යෝජිත පරිදි අවශ්‍යා ස්ථානවලට පැතිබැම් යෙදවීමට කටයුතු කර නොතිබුණ අතර මේ හේතුවෙන් වර්ෂා කාලයකදී පාරට හානි වියහැකි බව නිරීක්ෂණය කෙරේ. | මෙම ව්‍යාපෘතියෙහි පැති බැම්ම බැඳීම සඳහා මුදල් ප්‍රමාණවත් නොවූ බැවින් එය වෙනත් අදියරකින් සිදු කිරීමටත් මාර්ගය දැඩිලෙස අබලන්ව පැවති හෙයින් මාර්ගය කාපට් කර අවසන් කිරීමටත් කටයුතු කරන ලදී. එබැවින් පැති බැම්ම බැඳීම සඳහා මුදල් ප්‍රතිපාදනයක් ඉදිරියේදි ලබාගෙන එය නිම කිරීමට බලාපොරොත්තු වේ. | ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළයුතු බව. |
| (ජ) | දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ප්‍රාදේශීය ලේකම් සඳහා වෙන්කර ඇති විධායක මට්ටමේ උපලේඛනගත නිල නිවාසය දීර්ඝ කාලයක සිට වාසික කාර්යයන් සඳහා භාවිතා නොකර භාණ්ඩ ගබඩා කිරීම සඳහා භාවිතා කර තිබුණි. | මෙම නිල නිවස අවශ්‍යා ප්‍රතිසංස්කරණ කටයුතු සිදුකිරීමට තාක්ෂණ නිලධාරීන් විසින් සකසන ලද රු.4,610,182.98 ක් වටිනා සංශෝධිත ඇස්තමේන්තුවක් ප්‍රාදේශීය ලේකම් විසින් අනුමත කර එවා ඇති අතර අදාල ප්‍රතිපාදන ලබාගෙන ඉදිරි කටයුතු සිදුකිරීමට බලාපොරොත්තු වේ. | නිසි උපදෙස් වගකිවයුතු පාර්ශවයන්ගෙන් ලබාගෙන වත්කම් ඵලදායීව හා කාර්යක්ෂමව යොදාගත යුතු බව. |

| | | | |
|---|---|---|---|
| (ඡ) | බියගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතුව නිල නිවාස දෙක සමාලෝචිත වර්ෂය තුළ දී වාසික කාර්යයන් සඳහා භාවිතා කර නොාතිබුණි. | නිල නිවාස 02 පවතින අඩුපාඩු සකස් කිරීම සඳහා දළ ඇස්තමේන්තු සකස්කර ඇති අතර අදාල ප්‍රතිපාදන ලබාගෙන අළුත්වැඩියා කටයුතු සිදුකර ඉදිරියේදී භාවිතයට ගැනීමට බලාපොරොත්තු වේ. | -එම- |
| (ට) | කටාන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතු ග්‍රාම නිලධාරී නිල නිවාසය අබලන් වී ඇති හෙයින් 2019 සිට භාවිතයට ගෙන නොතිබුණි. | කටාන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතුව ඇත්ගාල සේවා පියස, හීනටියන සඳහා 2024 නව ඇස්තමේන්තු සකස් කර ප්‍රතිපාදන ලබාගැනීමට බලාපොරොත්තු වේ. | -එම- |
| (ඩ) | අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ප්‍රාදේශීය ලේකම් තනතුර සඳහා වෙන්කර ඇති නිල නිවස 2019 වර්ෂයේ සිට නිශ්කාර්යව පැවතුණි. වර්තමාන ප්‍රාදේශීය ලේකම්වරයා මෙහි පදිංචි නොවීම මත මෙය ගබඩා කටයුතු සඳහා දැනට භාවිතා කරන අතර නිසිපරිදි එම නිල නිවස නඩත්තු නොකිරීම හේතුවෙන් මේ වන විට එය අබලන් තත්වයට පත්ව තිබුණි. | නිල නිවස ඉතා පැරණි ගොඩනැගිල්ලක් වන අතර එය පදිංචියට සුදුසු නොවන බැවින් අලුත්වැඩියා කිරීමද ඵල රහිත ක්‍රියාවකි. ඉදිරියේදී ඇස්තමේන්තු සකස් කර ප්‍රතිපාදන ලබා ගැනිමට බලාපොරොත්තු වේ. දැනටමත් තාවකාලිකව ගබඩා කටයුතු සඳහා භාවිතා කරයි. | වත්කම් ඵලදායීව හා කාර්යක්ෂමව යොදාගත යුතු බව. |
| (ණ) | මීරිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2018 වසරේදී වැඩ ආරම්භ කල නිල සේවා ගොඩනැගිලි 7 ක් රු.1,433,908 ක් වියදම් දරා අඩක් පමණක් ඉදිකර තිබීම හේතුවෙන් භාවිතයට ගැනීමට නොහැකි වී තිබුණි. 2018 වසරේ දී ආරම්භ කල මෙම ව්‍යාපෘති වසර 5ක් පමණ ගත වී තිබුණ ද නැවත ඉදිකිරීම් ආරම්භ කිරීමට කටයුතු නොකිරීමෙන් වැයකරන ලද මුදලද නිෂ්කාර්ය වියදම් බවට පත් වී තිබුණි. | සියළුම සේවා පියස් හා නිල සෙවන කාර්යාල වල අඩුපාඩු සම්පූර්ණ කිරීම සඳහා ඇස්තමේන්තු සකස් කර ස්වදේශ කටයුතු අමාත්‍යාංශය වෙත යොමු කර ඇති අතර,අදාළ ඇස්තමේන්තු 2024 වර්ෂයේ අයවැය යෝජනා වෙත ඇතුළත් කර ඇති බව එම අමාත්‍යාංශය දන්වා ඇති බව කාරුණිකව දන්වා සිටිමි. | ව්‍යාපෘතිය නිමකර භාවිතයට ගතහැකි තත්වයට පත්කළයුතු බව. ගොඩනැගිලි භාවිත තත්වයට පත් කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන ඉල්ලුම් කර ව්‍යාපෘති නිමකිරීමට කටයුතු කළයුතු බව. |
| (ත) | වත්තල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ , දැල උතුර මාතෘ සායන ගොඩනැගිල්ල හා පුස්තකාල ගොඩනැගිල්ල ඉදිකිරීම 2020 වර්ෂයේ ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ ලද රු.500 000 ක ප්‍රතිපාදන හා 2021 වර්ෂයේ විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ ලද රු.400 000ක ප්‍රතිපාදන වලින් පිළිවෙලින් රු.491 ,091 ක් හා රු.388 242 ක් උපයෝජනය කර මෙම ගොඩනැගිල්ලේ අත්තිවාරම දමා ගඩොලින් වහල මට්ටම දක්වා පමණක් ඉදිකර ව්‍යාපෘතිය නිම නොකර අත්හැර දැමීමෙන් වැයකරන ලද මුදල ද නිශ්කාර්ය වියදමක් බවට පත්වී තිබුණි. | ගොඩනැගිල්ල අත්තිවාරම් දමා ගඩොලින් වහල මට්ටම දක්වා ඉදිකර ඇත. ප්‍රතිපාදන නොමැතිවීම හේතුවෙන් දැනට වැඩ නතර වී ඇත. ප්‍රතිපාදන ලබාගෙන ඉදිරි කටයුතු කිරමට බලාපොරොත්තු වේ. | කඩිනමින් ප්‍රතිපාදන ඉල්ලුම් කර ව්‍යාපෘති නිමකර භාවිතයට ගතහැකි තත්වයට පත්කළ යුතු බව. |

| | | | |
|---|---|---|---|
| (ඵ) | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13 සතු නිල සෙවන ගොඩනැගිලි 78 ක රාජකාරි කටයුතු සිදු කලද මූලික යටිතල පහසුකම් වන ජලය ,විදුලිය , සනිපාරක්ෂක පහසුකම් නොමැති අතර ගොඩනැගිලි වල ආරක්ෂිත වැටක් නොතිබීම,කාර්යාලයීය උපකරණ නොතිබීම, සිවිලිම සකස් කර නොතිබීම යනාදී අඩුපාඩු ද නිරීක්ෂණය විය. | නිල සෙවන කාර්යාලවල අත්‍යාවශ්‍යයෙන් ඉටුකල යුතු අඩුපාඩු සැකසීමට අවශ්‍ය ඇස්තමේන්තු ලබාගෙන ඊට අදාල අදාල ප්‍රතිපාදන සලසාගෙන ඉදිරි කටයුතු ඉටු කිරිමට බලාපොරොත්තු වේ. | අඩුපාඩු සොයාබලා භාවිතයට ගතහැකි තත්වයට පත්කළ යුතුය. |

### 3.4 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ස්වර්ණාභරණ හා පිත්තල නිමැවුම්කරුවන් සඳහා භාවිතා කිරීමට හා පුහුණු වැඩසටහන් පැවැත්වීමට රු.2,925,000ක වියදමක් දරා අත්තනගල්ල ප්‍රාදේශීය සභාව සතු බෝනෑගල වසමේ ක්‍රීඩා පිටිය සහිත භූමියේ මහල් දෙකකින් සමන්විත මෙම ගොඩනැගිල්ල ඉදිකර වසර 02 කට වඩා ගත වී තිබුණ ද භාවිතයට ගෙන නොතිබුණි. එසේම අවම යටිතල පහසුකම් වන ජලය, විදුලිය සපයා ගැනීමට නොහැකිවී තිබුණි. | ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව වෙත ලිඛිතව ඉදිරිපත් කල අතර, එයට පිළිතුරු ලෙස මාස කිහිපයක් තුලදී ජල විදුලිය සහිත අංගසම්පූර්ණ ගොඩනැගිල්ල සකස් කරදෙන බවට අත්තනගල්ල ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව විසින් එකගතාව පළකර ඇති බව දන්වමි. | වත්කම් භාවිතයට ගතහැකි තත්වයට පත්කර ඵලදායීව යොදාගතයුතු බව. |
| (ආ) | අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ව්‍යාපෘති අංක ATT/RIDP/16/146/3/2017 යටතේ අඩක් නිම කර තිබූ වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ වැඩ නිමකිරීම වෙනුවෙන් "2020 සපිරි ගමක් වැඩ සටහන" යටතේ රු.1,980,171ක් වැය කර තිබුණි. අදාළ බහුකාර්යය ගොඩනැගිල්ලේ සැලසුම අනුව 2023 ජූලි මස වන විට ශරීර සුවතා මධ්‍යස්ථානය සහ ඊට යාබද කාමර 03 හි බිත්ති බැද වහලය නිමකර ඇතත් භාවිතයට ගතහැකි මට්ටමකට අදාල ඉදිකිරීම් කටයුතු අවසන් කර නොතිබූ බැවින් වැයකළ මුදල නිශ්කාර්ය වියදමක් වී තිබුණි. | ග්‍රාමීය සංවර්ධන වැඩ සටහන 2017 හා සපිරිගම වැඩසටහන 2020 යටතේ ඉදිකර ඇත. මෙම වසරේ ද පළාත් සභා වැඩ සටහන, විමධ්‍යගත අයවැය වැඩ සටහන යටතේ මුදල් වෙන් කර ඇත. ඒ අනුව පවතින අඩුපාඩු සකස් කර ගැනීමට නියමිතය. ඉදිරියේදි අදාල ඉදි කිරීම් අවසන් කර ඵලදායි ලෙස යොදා ගැනීමට බලාපොරොත්තු වේ. | ගිවිසුම් කාලය තුළ ව්‍යාපෘතිය නිම කිරීමට කටයුතු කලයුතු බව |

**3.5 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සෞභාග්‍යා පේෂකර්ම ගම්මාන වැඩසටහන යටතේ දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය අස්සැන්නවත්ත ඉදිකර තිබූ පේෂකර්ම අලෙවි මධ්‍යස්ථානය, ප්‍රාදේශීය සභාව සතු ඉඩමක ඉදිකර තිබූ අතර අස්සැන්නවත්ත සෙක්කුවත්ත පුස්තකාල ගොඩනැගිල්ලේ උඩුමහලේ මෙම මධ්‍යස්ථානය ඉදිකිරීමට රු.2,925,909ක් වැයකර තිබූ නමුත් මෙම ගොඩනැගිල්ලේ වැඩ අවසන් කිරීමට නොහැකි වීම නිසා 2022 වසරේ ගම සමග පිළිසඳරක් වැඩසටහන යටතේ රු.1,261,981ක් වැයකර දෙවන මහලේ වැඩ අවසන් කර උඩුමහල පුස්තකාලය ලෙසත් පහළ මහල අලෙවි මධ්‍යස්ථානය ලෙසත් සකස් කර තිබුණ ද භාවිතයට ගෙන නොතිබුණි. | ගොඩනැගිල්ල තුල අස්සැන්නවත්ත සෞභාග්‍යා පේෂකර්ම අලෙවි මධ්‍යස්ථානය පවත්වාගෙන යාමට නොහැකි වුයේ ප්‍රාදේශීය සභාව විසින් විධිමත් ලෙස ගොඩනැගිල්ල ප්‍රාදේශිය ලේකම් වෙත පවරා නොදීම යන හේතුව මතය. මෙම ගැටළුව පිළිබඳව ප්‍රාදේශිය සම්බන්ධීකරණ කමිටුව වෙත යොමු කරන ලද අතර ඒ අනුව 2024 ජනවාරි 23 ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු සභාපති තුමාගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලද ක්ෂේත්‍ර පරීක්ෂාවට අනුව ගොඩනැගිල්ලේ පහත මහල අලෙවි මධ්‍යස්ථානය පවත්වාගෙන යාමට හැකි ආකාරයට සකස්කරන ලෙසට ප්‍රාදේශිය සභා වැඩ අධිකාරි වෙත උපදෙස් ලබා දෙන ලදී. | ගොඩනැගිල්ල විධිමත් ලෙස ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට පවරාගෙන අලෙවි මධ්‍යස්ථානයේ කටයුතු ආරම්භ කලයුතු බව. |
| (ආ) | ග්‍රාම ශක්ති ජනතා ව්‍යාපාර වැඩසටහන - 2017 වර්ෂයේ දී ආරම්භකර ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13 තුල සමිති 152 ක් පිහිටුවා රු.155,617,450ක ප්‍රතිපාදන ලබාදී තිබුණ ද, රු.99,951,670 ක් මව් ගිණුම සහ ක්ෂුද්‍ර මූල්‍ය ගිණුම්වලට ලබාදී ඇති අතර රු.73,123,443ක් එම ගිණුම්වලම නිශ්කාර්යව පැවතුණි. සමිති 21 ක් පමණක් සක්‍රීය මට්ටමේ පවතින අතර සමිති 131 ක් අක්‍රීය මට්ටමේ පවතින අතර පුද්ගලයින් 95දෙනෙකු වෙත ලබාදුන් රු.2,451,275ක ණය මුදලක් බොල්ණය බවට පත්වී තිබුණි. | 2021 වර්ෂයේ මුල් කාර්තුව තුළ රටේ ඇති වූ කොරෝනා තත්වය නිසා ග්‍රාම ශක්ති සමිති අක්‍රීය තත්වයට පත් විය. මව් ගිණුම්වල මුදල් උපයෝජනය කල යුතු ආකාරය පිළිබඳ උපදෙස් 2020 හා 2021 වර්ෂවල නොලැබුණු බවද පෙන්වා දෙමි. 2021 මාර්තු 12 ලිපිය මගින් මා වෙත දන්වා ඇති පරිදි ලියාපදිංචියෙන් ඉවත් කර ගැනීමට අවශ්‍ය ලිපිලේඛණ මේ වන විට යොමුකර ඇත. | ව්‍යාපෘතියේ අරමුණු ඉටුකරගැනීමට කටයුතු කලයුතු බව.<br>අයකරගත හැකි විකල්ප ක්‍රියාමාර්ග මගින් ණයපාළී අයකරගැනීමට කඩිනම් ක්‍රියාමාර්ග ගතයුතු බව. |

## 3.6 ප්‍රසම්පාදනයන්

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | | | |
| (i) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.6 ඡේදය ප්‍රකාරව ලංසු විවෘත කිරීම පිළිබඳ කටයුතු නියමිත ආකෘති පත්‍රයක වාර්තා කලයුතු අතර එම වාර්තා සටහන් ලංසු විවෘත කිරීමේ කමිටුවේ සියලු සාමාජිකයන් විසින් අත්සන් කළ යුතුය. නමුත් ලංසු විවෘත කිරීමේ කමිටුව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන වලට අනුව කටයුතු කර නොතිබුණි. | ඉදිරි ප්‍රසම්පාදන කටයුතු වලදී අදාල අකෘති පත්‍ර යොදාගන්නා ලෙස හා අදාල චක්‍රලේඛ උපදෙස් කෙරෙහි අවධානය යොමුකර කටයුතු කරන ලෙස අදාල නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව කටයුතු කළයුතු බව. |
| (ii) | 2023 අප්‍රේල් 28 දින විවෘත කරන ලද මිලගණන් සම්බන්ධයෙන් තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාවක් දින රහිතව ඉදිරිපත් කර තිබුණි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.3(ආ) ඡේදය ප්‍රකාරව කමිටුවේ රැස්වීම්වල වාර්තා ප්‍රසම්පාදන අත්පොතේ අඩංගු නිශ්චිත ආකෘතියකට අනුව වාර්තාගත කළයුතු අතර එය පැමිණ සිටින සාමාජිකයින් විසින් සහතික කළ යුතුය. ආපනශාලාව පවත්වාගෙන යාම සම්බන්ධ තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාව එලෙස නියමිත ආකෘතියේ ඉදිරිපත් කර නොතිබුණු අතර කමිටුවේ එක් සාමාජිකයෙකු අත්සනකර නොතිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.6 පරිදි ලංසු විවෘත කිරීම පිළිබද වාර්තා සටහන් තබාගැනීමේ අකෘතිය රැස්වීම සදහා සහභාගී වීම හා ලංසු විවෘත කිරීමේ සටහන්වල අකෘති පත්‍ර සම්පූර්ණ කර නොමැති නමුත් ලංසු විවෘත කිරීමේ කමිටුව විසින් විවෘත කරන ලද ලංසු මත කෙටි අත්සන යොදා ඇත. ඉදිරි ප්‍රසම්පාදන කටයුතු වලදී අදාල අකෘති පත්‍ර යොදාගන්නා ලෙස හා අදාල චක්‍රලේඛ උපදෙස් කෙරෙහි අවධානය යොමුකර කටයුතු කරන ලෙස අදාල නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත. | -එම- |
| (iii) | රාජ්‍ය ආයතන විසින් ආපනශාලා පවත්වාගෙන යාමේ දී සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය නිකුත් කළ අංක 01-17/2015 දරන 2015 අප්‍රේල් 29 දිනැති චක්‍රලේඛය අනුගමනය කළ යුතු වුවත් මෙම ප්‍රසම්පාදනයේදී හා ගිවිසුම්ගත වීමේදී දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් මෙම ප්‍රතිපාදන පිළිබඳව සැලකිලිමත් වී නොතිබුණි. | රාජ්‍ය ආයතන විසින් ආපනශාලා පවත්වාගෙන යාමේ සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශ නිකුත් කල 01-17/2015 දරන 2015 අප්‍රේල් 29 දිනැති චක්‍රලේඛය ප්‍රකාරව ඉදිරියේදී කටයුතු කිරීමට නිලධාරීන්ට උපදෙස් ලබාදී ඇත. | -එම- |

| | | | |
|---|---|---|---|
| (ආ) | මීගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සඳහා ලිපිද්‍රව්‍ය මිලදී ගැනීම රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය-2006 හි 5.6.1 හි (ඇ) දැක්වෙන පරිදි ප්‍රසම්පාදනය කිරීමට ඇති භාණ්ඩයෙහි වෙළඳ නාමය පිරිවිතරයක් සේ සලකා නොබැලිය යුතු වුවද ලිපිද්‍රව්‍ය මිලදී ගැනීමට අදාල නියැදි පරීක්ෂාවේදී අවම මිල ගණන් ප්‍රතික්ෂේප කර තිබුණේ වෙළඳ සන්නාම නොමැති බව දක්වමිනි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 2006 හි 3.4.3 (ඇ) ප්‍රකාරව සැපයුම්කරුවන් ලියාපදිංචි කර ඇති විට ලියාපදිංචි කල ආයතනවලින් පමණක් මිල ගණන් කැඳවිය යුතු වුවද මිල කැඳවා ඇති ආයතන 09 ම ලියාපදිංචි නොාවූ ආයතන බව නිරීක්ෂණය විය. | මිගමුව නාගරික බල ප්‍රදේශයේ පහසුවෙන් කඩිනමින් ලිපි ද්‍රව්‍ය ලබා ගැනීම සඳහා කාර්යාලය අවට සැපයුම්කරුවන්ගෙන් මිල ගණන් කැඳවීම සිදු කර තිබූ අතර එම සැපයුම්කරුවන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ලියාපදිංචි වන ලෙස ලිඛිතව දන්වා යැවීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | -එම- |
| (ඇ) | වත්තල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නව ගොඩනැගිල්ල සඳහා කාර්යාල උපකරණ මිලදී ගැනීමේදී රු.2,470,358 ක වියදමක් දරා ඇතත් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.2 වගන්තිය අනුව ජාතික තරඟකාරී ලංසු කැඳවීම භාවිතා කිරීමකින් තොරව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.9 වගන්තිය අනුව වෙළඳපොළ මිල සැඳහුම් ක්‍රමයට සීමිත මිල ගණන් ලබාගැනීම සිදුකර තිබුණි. | නව කාර්යාල ගොඩනැගිල්ල 2023 දෙසැම්බර් 17 දින අග්‍රාමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් විවෘත කිරීමට කටයුතු සූදානම් කරන ලෙස ලැබුණු කෙටි දැනුම් දීමක් මත ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ලියාපදිංචි ආයතන අතුරින් හා ප්‍රසිද්ධ වෙළඳ නාමයක් ඇති ආයතන වලින් මිළ ගණන් කැඳවූ බව කාරුණිකව දන්වමි. මේ සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රසම්පාදන කමිටුවේ ආවරණ අනුමැතිය ලබාගෙන ඇති බව වැඩිදුරටත් දන්වා සිටිමි. | -එම- |
| (ඇ) | ජා-ඇල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කැබ්රථය සඳහා රු.208,800ක් බැගින් ටයර් 4 ක් මිලදී ගැනීම සහ රු.237,000ක පරිගණකයක් මිලදී ගැනීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.6 සහ 5.2.1(අ) වගන්තියට අනුව ලංසු කැඳවීමේ ලේඛනවල අන්තර්ගත විය යුතු මිලදීගැනීමට බලාපොරොත්තු වන භාණ්ඩවල පිරිවිතරයන් ඉදිරිපත් නොකර පිරිවිතරවලට නොගැලපෙන බව පවසමින් අවම මිල ප්‍රතික්ෂේප කර තිබුණි. | අදාල මිලදි ගැනිමේදී අවම මිළ යන ක්‍රියාවලියෙන් බැහැරව රථයේ දිගු කාලීන පැවැත්ම පදනම් කර ගනිමින් G.T.Super වර්ගය ලංසු ඉදිරිපත් කර ඇති ලෝරා ටයර් ආයතනයෙන් මිලදී ගැනීමට තාක්ෂණික කමිටුව තීරණය මත ප්‍රසම්පාදන කමිටුව එම තීරණය අනුමත කර අදාල මිලදීගැනීම සිදුකරන ලදී. Sap Computers ආයතනය බැටරිය සඳහා අවම මිළ ගනන් ඉදිරිපත් කර ඇති නමුත් ආයතන වගකීම් කාලය පැහැදිලිව ඉදිරිපත් කර | -එම- |

නොමැත. මිලදීගත් ආයතන වන AMW Computers බැටරිය සඳහා වසරක වගකීම් කාලයක් සඳහන් කර ඇති නිසා එම ආයතනයෙන් මිලදී ගැනීමට තාක්ෂණික කමිටුව තීරණය කර ඇති බව දැනුම් දෙමි.

## 3.7 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මීරිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ට්‍රැක්ටරය හා බවුසරය වසර ගණනාවක සිට නිශ්කාර්යව පැවතුණි. | අදාළ ට්‍රැක්ටර් රථය හා බවුසර් රථය හදිසි ආපදා තත්ත්වයකදී ප්‍රයෝජනයට ගැනීම සඳහා කාර්යාලයේ භාවිතයට ගෙන ඇත. | වත්කම් ඵලදායීව හා කාර්යක්ෂමව යොදාගැනීම් කළයුතු බව. |
| (ආ) | මීගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතුව නිල නිවාස 02 ක් පවතින අතර රු.16,462,938 ක් වටිනා ප්‍රාදේශීය ලේකම් නිල නිවස භාවිතයට නොගන්නා අතර උඩයාර්තොප්පුව ග්‍රාම නිලධාරී නිල නිවාසය තක්සේරු කර නොතිබුණි. | මීගමුව ප්‍රාදේශීය ලේකම් නිල නිවාසය සමෘද්ධි මූලස්ථානයේ ඉඩ පහසුකම් ප්‍රමාණවත් නොවීම මත දැනට සමෘද්ධි මහ සංගමයට අයත් භාණ්ඩ එම ගොඩනැගිල්ලේ තැන්පත් කර ඇති අතර උඩයාර්තෝප්පුව ග්‍රාම නිලධාරී නිල නිවාසය භාවිතයට ගත නොහැකි මට්ටමක පවතින බව කාර්යාලයේ තාක්ෂණික නිලධාරී වාර්තාකර ඇත. | -එම- |
| (ඇ) | දොම්පේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය තුළ වසා දැමූ පාසල් 02ක ගොඩනැගිලි භාවිතා කළ නොහැකි මට්ටමේ පැවතුණු අතර මෙම ගොඩනැගිලි අළුත්වැඩියා කර ඵලදායී කාර්යයක යෙදවීමට කටයුතු කර නොතිබුණි. | ගොඩනැගිලි දෙකක් අලුත්වැඩියා කිරීමට සුදුසු තත්ත්වයක නොපවතින බව. | වත්කම් ඵලදායීව හා කාර්යක්ෂමව යොදාගත යුතු බව හා ප්‍රයෝජනයට ගතහැකි ගොඩනැගිලි සම්බන්ධයෙන් නොපමාව සොයාබලා අවශ්‍ය ක්‍රියාමාර්ග ගතයුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | මීනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ආපදා අංශය සතු ට්‍රැක්ටර 02ක්ද ටේලර් 02ක්ද 2017 න් පසුව ධාවනය කර නොතිබුණි. මෙම ට්‍රැක්ටර් රථ වසර ගණනාවක් එකම ස්ථානයක නවතා තිබීම හේතුවෙන් බැටරි රෝද ඇතුළු උපාංග අක්‍රිය මට්ටමක පැවතුණි. | මීනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අක්‍රීයව පැවති ට්‍රැක්ටර් දෙක සහ බවුසර් දෙක එවකට සිටි දිස්ත්‍රික් ලේකම්ගේ උපදෙස් පරිදි 2023 ඔක්තෝම්බර් 23 දින මීනුවන්ගොඩ නගර සභාව වෙත එහි අවශ්‍යතා සඳහා භාවිතය පිණිස තාවකාලිකව පවරා ඇත. | වත්කම් ඵලදායීව හා කාර්යක්ෂමව යොදාගත යුතු බව. |
| (ඉ) | දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ප්‍රාදේශීය ලේකම් සඳහා වෙන්කර ඇති විධායක මට්ටමේ උපලේඛනගත නිල නිවාසය දීර්ඝ කාලයක සිට වාසික කාර්යයන් සඳහා භාවිතා නොකර භාණ්ඩ ගබඩා කිරීම සඳහා භාවිතා කර තිබුණි. | මෙම නිල නිවස අවශ්‍ය ප්‍රතිසංස්කරණ කටයුතු සිදුකිරීමට තාක්ෂණ නිලධාරීන් විසින් සකසන ලද රු.4,610,182ක් වටිනා සංශෝධිත ඇස්තමේන්තුවක් ප්‍රාදේශීය ලේකම් විසින් අනුමත කර එවා ඇති අතර අදාල ප්‍රතිපාදන ලබාගෙන ඉදිරි කටයුතු සිදුකිරීමට බලාපොරොත්තු වේ. | නිසි උපදෙස් වගකිවයුතු පාර්ශවයන්ගෙන් ලබාගෙන වත්කම් ඵලදායීව හා කාර්යක්ෂමව යොදාගත යුතු බව. |
| (ඊ) | මීරිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ට්‍රැක්ටරය හා බවුසරය වසර ගණනාවක සිට නිශ්කාර්යව පැවතුණි. | අදාළ ට්‍රැක්ටර් රථය හා බවුසර් රථය හදිසි ආපදා තත්ත්වයකදී ප්‍රයෝජනයට ගැනීම සඳහා කාර්යාලයේ භාවිතයට ගෙන ඇත. | වත්කම් ඵලදායීව හා කාර්යක්ෂමව යොදාගත යුතු බව. |
| (උ) | අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විධායක නොවන නිල නිවාස වලින් එකක් හිරිපිටියෙහි ග්‍රාම නිලධාරී වසමේ පිහිටා තිබෙන අතර එය මේ වන විට භාවිතය සඳහා සුදුසු තත්වයේ නොපවතින බැවින් 2021 වර්ෂයේ සිට වාසික කාර්යයන් සඳහා භාවිතා කර නොතිබුණි. 2022 දෙසැම්බර් 10 දින හෝ 2022 දෙසැම්බර් 11 දින අදාල නිල නිවසට බාහිර පාර්ශවයක් ඇතුළු වී අලාභ හානි කර ඇති අතර මේ සම්බන්ධව මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | අත්තනගල්ල කොට්ඨාශයේ 329/සී හිරිපිටිය මැද ග්‍රාම නිලධාරී නිල නිවසට අලාභ හානි සිදුවීම සම්බන්ධව මු.රෙ. 104 අනුව කටයුතු කිරීම සඳහා කමිටුවක් පත් කරන ලද අතර, අවසන් පරීක්ෂණ ලැබී ඇති අතර ඒ අනුව ඉදිරි කටයුතු කඩිනමින් සිදු කරන ලෙස අදාල නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත. | හානියට වගකිවයුතු පුද්ගලයන්ගෙන් අයකරගැනීමට කටයුතු කළ යුතු අතර වත්කම් නිසිපරිදි ඵලදායී කාර්යයක යොදාගත යුතු බව. |
| (ඌ) | දොම්පෙ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ රු.10,500,000ක් වටිනා නිල සෙවන කාර්යාල 07 ක් තක්සේරු කර නොතිබුණි. | කාර්යාල 3ක ඉඩම්, පෞද්ගලික ඉඩම් බැවින් තක්සේරු කිරීම සඳහා යොමු කළ නොහැකි බව දන්වා ඇත. ඉතිරි කාර්යාල 4 මිනින්දෝරු දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමට අවශ්‍ය ලේඛන සකස් කරමින් පවතී. | වත්කම් තක්සේරු කිරීමට කටයුතු කළ යුතුය. |
| (එ) | බියගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ රු.5,500,000ක් වටිනා නිලසෙවන කාර්යාල 06 ක් රජය සතු ඉඩමක පිහිටා ඇති නමුත් තක්සේරු කර නොතිබුණි. | මිනින්දෝරු දෙපාර්තමේන්තුව මඟින් මැනුම් කටයුතු ආරම්භ කර ඇති අතර අදාළ කටයුතු අවසන්කර කඩිනමින් ගිණුම්ගත කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරනු ලැබේ. | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඒ) | මහර ප්‍රාදේශීය ලේකම් කාර්යාල බලප්‍රදේශය තුළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් නිල සෙවන හා සේවා පියස් 2ක් ද රජයට අයත් නොවන ඉඩම්වල ඉදිකර තිබූ නිලසෙවන හා සේවාපියස් 11ක් ද තක්සේරු කර නොතිබුණි. | පෞද්ගලික ඉඩම් 2 හැර මේ වන විට මිනින්දෝරු දෙපාර්තමේන්තුව මගින් මැනුම් කටයුතු ආරම්භ කර ඇති අතර කඩිනමින් ගිණුම්ගත කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරනු ලැබේ | වත්කම් වටිනාකම් තක්සේරු කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඔ) | අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශය තුළ සේවා පියස් / නිල සෙවන කාර්යාල 22 ක් පවතියි. එයින් නිල සෙවන/ සේවා පියස් 09 ක අයිතිය මෙම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතුව පවතින අතර ඒවායේ ගොඩනැගිලි පමණක් තක්සේරු කර ගිණුම්ගත කර ඇතත් ඉඩමෙහි වටිනාකම තක්සේරු කර නොතිබුණි. | 2023 මාර්තු 20 දිනැති අත්/03/08-නිලසෙවන ලිපිය මගින් තක්සේරු දෙපාර්තමේන්තුව වෙත දන්වා ඇති අතර 2023 ජුනි 13 හා 2023 සැප්තැම්බර් 20 දිනැති ලිපි මගින් සිහි කැඳවීම් සිදු කර ඇත. | ඉඩම්වල වටිනාකම තක්සේරු කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඕ) | කටාන ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ ඇත්ගාල සේවා පියස , හීනටියන හා අලයතුපිටිය නිල සෙවන හා සේවා පියස් කාර්යාල 03ක වටිනාකම තක්සේරු කර නොතිබුණි. | තාක්ෂණ නිලධාරි විසින් ඇත්ගාල නිල නිවස (ග්‍රා.නි.) භාවිතයට සුදුසු නොවන බව වාර්තා කර ඇත. | -එම- |
| (ක) | අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පාසැල් 3ක් ද, මීනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පාසැල් 5 ක් ද, දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පාසැල් 4ක් ද, මීරිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පාසැල් 2ක් ද, වසා දමා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත පවරා දී ඇතත් ඉඩම් හා ගොඩනැගිලිවල වටිනාකම තක්සේරු කර නොතිබුණි. | මීරිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට පවරා දී ඇති පාසල් දෙක සම්බන්ධයෙන් වටිනාකම් තක්සේරු කිරීමට යවා ඇත. අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ වසා දමන ලද පාසල් 3 ප්‍රාදේශීය ලේකම් වෙත පවරා දී ඇත. මෙම ඉඩම් ක්‍රීඩා පිටියක් බවට සංවර්ධනය කිරීම සඳහා 2021 ඔක්තෝබර් 29 දින අත්තනගල්ල ප්‍රාදේශීය සභාව වෙත ඉඩමේ භුක්තිය බාර දීමට කටයුතුකර ඇත.මීනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වසා දමා ඇති පාසල් 4න් 3ක් ඵලදායී කටයුතු සඳහා යොදවාගෙන ඇත. | -එම- |

### 3.8 පාඩු හා හානි

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් විසින් 2017 ජුලි 19 දිනැති ලිපියෙන් ආපදා අංශය සතු ට්‍රැක්ටර් බවුසර් 03 බදුල්ල දිස්ත්‍රික්කයේ උමා ඔය ව්‍යාපෘති කටයුතු සඳහා මුදා හැර තිබුණි. 2018 අප්‍රේල් 05 දින ට්‍රැක්ටර් බවුසර 3 ආපසු ලබා දී | උමා ඔය සඳහා බවුසර් රථ මුදා හැර ඇති අතර එම රථ නැවත භාර දීමේදී අදාල රථ වල සිදු වී තිබූ අඩුපාඩු පිළිබඳව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ජාතික | මුදල් රෙගුලාසි අනුව කටයුතු කර අලාභය අයකරගැනීමට කටයුතු කළයුතුය. |

| | | | |
|---|---|---|---|
| | තිබුණ ද, සුදු යකඩ බද දෙපසම දැඩි ලෙස තැලීමකට ලක්වීම සංඥා ලාම්පු විනාශ වීම, අමතර උපාංග අස්ථාන ගත වීම වැනි විශාල හානියක් සිදු වී තිබුණි. ඒ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබු අතර ඒ පිළිබද ලොග් පොත්වල කිසිදු සටහනක් දක්වා නොතිබුණි. 2018 වර්ෂයේ මෙම අලාභය සිදුවී ඇතත්, මුදල් රෙගුලාසි අනුව කටයුතු කර වගකිවයුතු නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ආපදා සහන සේවා මධ්‍යස්ථානය වෙත ලිඛිතව දැනුම් දී ඇත. මේ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු සිදු කරන ලෙස අදාල නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත. තවද මේ සම්බන්ධව නව වියදම් ඇස්තමේන්තුවක් සකස් කර ප්‍රතිපාදන ලබාගැනීමට බලාපොරොත්තු වෙමි. | |
| (ආ) | මීනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් කැබ් රථය 1999 ජූලි මස අනතුරට පත්වීමෙන් සිදු වී තිබූ අලාභයෙන් රක්ෂණයෙන් අයකර ගත නොහැකි අලාභය වූ රු.189,360ක් වැන් රථයේ රියදුරුගෙන් අයකර ගැනීම සඳහා නෛතික කටයුතු ආරම්භකර ඇතත් 2023 දෙසැම්බර් 31 දින වන විට වසර 25කට ආසන්න කාලයක් ගතවී ඇතත් අදාළ අලාභය අයකර ගැනීමට නොහැකි වී තිබුණි. | නඩු කටයුතු අසාමාන්‍ය ලෙස ප්‍රමාද වී ඇති බැවින් නීතිපති සහය ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරන ලෙසට මීනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් දැනුවත් කර ඇත. | අලාභය අයකරගැනීමට කටයුතු කළයුතුය. |
| (ඇ) | අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සමෘද්ධි හා ක්ෂේත්‍ර අංශවල ප්‍රින්ටරයක් 2022 ඔක්තෝබර් 17 දින අස්ථානගතවී තිබුණි. මුදල් රෙගුලාසි 104(3) යටතේ සිදුකරන ලද අලාභයන් පිළිබඳ ප්‍රාරම්භක වාර්තාවට අනුව අලාභයේ වටිනාකම රු.34,560ක් බව තක්සේරු කර තිබුණද අලාභය ආරක්ෂක සේවා ආයතනයෙන් අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි. | සමෘද්ධි හා ක්ෂේත්‍ර අංශ වල ප්‍රින්ටරයක් අස්ථාන ගත වීමට අදාළව මු.රෙ. 104(4) යටතේ අලාභයන් පිළිබඳ අවසාන වාර්තාව ලබාගෙන ඇත. එසේම පොලිස් විමර්ශන වල වර්තමාන තත්වය විමසන ලදුව නිට්ටඹුව පොලිස් ස්ථානයෙන් ලබා ගන්නා ලද වත්මන් තත්වය පිළිබඳ වාර්තාව කැඳවා ඇති අතර ඒ අනුව ඉදිරි කටයුතු සිදු කරනු ලැබේ. | -එම- |
| (ඈ) | 2021 ඔක්තෝබර් මස 20 දින ගම්පහ දිස්ත්‍රික් මෝටර් රථ කාර්යාලයට අයත් සංඥා කුළුන කඩා වැටීම නිසා මුදල් රෙගුලාසි 104(4) යටතේ සිදුකරන ලද අලාභයන් පිළිබඳ පරීක්ෂණ අවසන් වාර්තාව අනුව සැලසුම් අංශ ගොඩනැගිල්ලට හා එහි උපකරණවලට සිදුවී තිබූ අලාභය රු.861,938ක් විය. මුදල් රෙගුලාසි 104(1)(ආ) ප්‍රකාර විධිමත් පරීක්ෂණයක් පැවැත්වීම සඳහා කමිටුවක් පත් කිරීම ගම්පහ දිස්ත්‍රික් ලේකම් විසින් නිර්දේශ කර තිබුණු අතර අදාළ කටයුතු පමාවීම හේතුවෙන් මෙම අලාභය අයකර ගැනීමට හෝ කපා හැරීමට කටයුතු කර නොතිබුණි. | අලාභය නොගෙවන්නේ නම් නීතිමය ක්‍රියාමාර්ග ගැනිමට සිදුවන බව දන්වමින් ලංකා බෙල් ආයතනය වෙත ලිපි මගින් දන්වා ඇත. ඒ අනුව සුදුසු කටයුතු කිරිමට බලාපොරොත්තු වේ. | -එම- |

**3.9 කළමනාකරණ දුර්වලතා**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාජ සවිබලගැන්වීම් හා සුභ සාධන අමාත්‍යාංශයේ 2016 ජනවාරි 12 දිනැති චක්‍රලේඛ අංක 1/2016 ප්‍රකාරව ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් නිකුත් කරනු ලබන දීමනා ගෙවීමේ සහතික පත්‍රය අනුව දීමනාලාභීන්ට මාසික දීමනාව උප තැපැල් කාර්යාල, තැපැල් කාර්යාල හා දිවි නැගුම බැංකු මගින් පමණක් ගෙවිය යුතු වුවද මීගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වැඩිහිටි පොරොත්තු ප්‍රතිලාභීන් 580 දෙනෙකු සඳහා රු.2,900,000ක් ග්‍රාම නිලධාරී හරහා ගෙවීම් සිදු කර තිබුණි. | වඩාත් සුදුසු ප්‍රතිලාභින් තෝරා පත්කර ගෙන 2024 ජනවාරි මස සිට දීමනා ගෙවීම තැපැල් කාර්යාල මගින් සිදු කිරීමට කටයුතු කරන ලදි. | -එම- |
| (ආ) | සමාජ සවිබලගැන්වීම් හා සුභ සාධන අමාත්‍යාංශයේ 2016 ජනවාරි 12 දිනැති චක්‍රලේඛ 1/2016 චක්‍රලේඛයේ 5.5 ප්‍රකාරව වැඩිහිටි දීමනා සෑම මසකම 15 වන දිනෙන් ආරම්භ වී වැඩකරන දින 07 ක් තුල සෑම තැපැල් / උපතැපැල් කාර්යාල හා දිවිනැගුම බැංකු මගින් ගෙවීමට කටයුතු කල යුතු වුවද මීගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2023 ජූලි, අගෝස්තු ප්‍රතිපාදන ප්‍රමාද වී ලැබී තිබූ අතර එම නිසා රු.2,112,200ක මුදල් ගෙවීමට නොහැකි වීම මත තැපැල් කාර්යාල විසින් හරවා එවා තිබුණි. | මේ සම්බන්ධයෙන් ග්‍රාම නිලධාරීන් හරහා ප්‍රතිලාභීන් දැනුවත් කලද ඔවුන් මුදල් ලබා ගැනීමට නොපැමිණි බැවින් රු.2,112,200ක මුදලක් අධිභාර වී තිබේ. | -එම- |
| (ඇ) | ගම්පහ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13 හි සිටින පවුල් අතරින් අනවසර නිවාස තුළ ජීවත් වන පවුල් 11,851ක් ද, තාවකාලික නිවාස වල ජීවත් වන පවුල් 13,870ක් ද, වැසිකිළි පහසුකම් නොමැති පවුල් 4,137ක් ද, පොදු ජල කරාම භාවිතා කරන පවුල් 9,351ක් ද, විදුලිය නොමැති නිවාස 1,942ක් ද, මාර්ග පහසුකම් නොමැති නිවාස 3,968ක් ද වශයෙන් ජීවත් වීම සඳහා අවශ්‍ය අවම පහසුකමක්වත් නොමැතිව ජීවත් වන පිරිස පිළිබඳව රජයේ අවධානය | තවදුරත් පවතින අඩුපාඩු නිවැරදි කිරීමට ක්‍රියාමාර්ග ගන්නා ලෙස ප්‍රාදේශීය ලේකම්වරු වෙත දන්වා ඇත. | අවම පහසුකම් නොමැතිව සිටින පිරිස් නගා සිටුවීම සඳහා විශේෂ අවධානය නැවත යොමු කළයුතු බව |

| | | | |
|---|---|---|---|
| | යොමුකර එම පවුල්වලට ජීවත්වීම සඳහා මූලික පහසුකම් ලබාදීමට සුදුසු වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම කෙරෙහි අවධානය යොමු වී නොතිබුණි. | | |
| (ඇ) | වැඩ තහනමකට ලක්ව ඇති මිනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරිණියකට 2010 වසරේ අගෝස්තු මාසයේ දී ආපදා ණය ලබා දී තිබූ අතර ඒ වන විට ද තනතුරේ සථිර කිරීමට නියමිත සුදුසුකම් සනාථ කිරීමට නොහැකි වීම මත සේවා කාලය වසර 10ක් ගතවී තිබුණද සේවයේ ස්ථිර කර නොතිබුණි. ආයතන සංග්‍රහයේ xxivහි 10.4 ප්‍රකාරව ඇප රහිතව ණය ලබාදිය හැක්කේ සේවා කාලය අවුරුදු 10ට වැඩි ස්ථිර නිලධාරීන්ට වුවද අදාල නිලධාරිණිය ස්ථිර කර නොතිබිය දී ඒ පිළිබඳව සැලකිලිමත් වීමකින් තොරව මෙම ණයමුදල ලබා දී තිබීම හේතුවෙන් තවදුරටත් රු.62,483ක් අයවීමට පැවතුණි. අදාල ණය ඉල්ලීමේ ලිපිය ආයතන අංශය විසින් අංක 04 යටතේ අසා ඇති පරිවාස කාලය අවසානයේ දී තනතුරේ ස්ථිර කිරීමට ඉඩ තිබේ ද යන්න " ඔව් " ලෙස සම්පූර්ණ කිරීම හේතු වී තිබුණි. | නිලධාරිණිය වෙත නිරන්තරයෙන් දැනුවත් කිරීම සිදු කරමින් ණය අයකර ගැනීමට අඛණ්ඩවම කටයුතු කරමින් පවතින බව සඳහන් කරමි. | ආයතන සංග්‍රහයේ විධිවිධාන වලට අනුව කටයුතු කළ යුතුය. වගකිවයුතු නිලධාරීන් සම්බන්ධයෙන් මු.රෙ 156(1) ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඉ) | අදාල මාසය ආරම්භ වීමට පෙර ක්ෂේත්‍ර නිලධාරීන් විසින් ඉදිරි වැඩ සටහන අධීක්ෂණ නිළධාරී වෙත ඉදිරිපත් කර අනුමත කරගත යුතු වුවත් දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ එම ඉදිරිවැඩසටහන් ප්‍රමාද වී ඉදිරිපත්කර තිබුණ ද අධීක්ෂණ නිළධාරීන් ඒ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. මේ හේතුවෙන් නිළධාරීන් පුරුද්දක් ලෙස ඉදිරි වැඩසටහන් ප්‍රමාද වී ඉදිරිපත් කිරීමේ ප්‍රවණතාවයක් ඇතිවී තිබුණි. | ක්ෂේත්‍ර නිලධාරීන්ගේ ඉදිරි වැඩසටහන් අදාල මාසයේ ආරම්භක දිනට සතියකට පෙර හා කළ වැඩසටහන් ඊළග මාසයේ පළමු සතිය තුල ඉදිරිපත් කිරීමට සියලු ක්ෂේත්‍ර නිලධාරීන් දැනුවත් කර ඇති බව කාරුණිකව දන්වා සිටිමි | මාසය ආරම්භ වීමට පෙර ඉදිරිවැඩසටහන් අනුමතකරගත යුතු බව. |
| (ඊ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ආරක්ෂක හා සනීපාරක්ෂක සේවාව අදාල සේවා ගිවිසුම් දෙකෙහි 16 වගන්තිය ප්‍රකාරව සැපයුම්කරු විසින් සේවයේ යොදවන සේවකයින්ගේ වයස අවු. 18ට අඩු | එවකට රටෙහි පැවති කොවිඩ් වසංගත තත්ත්වය මත වෙනත් විකල්පයක් නොතිබු බැවින් එසේ කටයුතු කිරීමට සිදුවී ඇත. | ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළයුතු බව. |

| | | |
|---|---|---|
| නොවිය යුතු හා අවු. 65 ට වැඩි නොවිය යුතු නමුත් වර්ෂය තුළ ආරක්ෂක හා සනීපාරක්ෂක සේවය සැපයූ සැපයුම් කරුවන් දෙදෙනා විසින් යොදවා තිබූ සේවකයින්ගේ වයස අවුරුදු 66-79 අතර සේවකයින් වූ නමුත් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මේ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | | |

**4.** **තිරසර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් තිරසාර සංවර්ධන අරමුණු **11** ක් හඳුනා ගෙන ඒ සඳහා ඉලක්ක 20 ක් හඳුනා ගෙන තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට එම ඉලක්ක ඉටුකර ගැනීමේ ප්‍රගතිය අපේක්ෂිත ඉලක්ක **12** ක් සඳහා සියයට 1 සිට සියයට 49 ක්,අපේක්ෂිත ඉලක්ක **5** ක් සඳහා සියයට 50 සිට සියයට 74ක් හා ඉලක්ක **3** ක් සඳහා සියයට 75 සිට සියයට 100 අතර ප්‍රමාණයක පැවැතුණි. | 2024 වර්ෂයේ සිට අදාල අරමුණු ඉටුකර ගැනීමේ ප්‍රගතිය ඉහල මට්ටමක් පවත්වාගෙන යාමට බලාපොරොත්තු වේ. | අපේක්ෂිත ඉලක්ක ඉටුකර ගැනීමට කටයුතු කළ යුතු බව. |

**5.** **මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13 ක අනුමත සේවක සංඛ්‍යාව විස්තර අනුව මාණ්ඩලික ශ්‍රේණියේ තනතුරු 4 ක් ද තෘතීයික ශ්‍රේණියේ තනතුරු 4 ක් ද ද්විතීයික ශ්‍රේණියේ තනතුරු 310 ක් ද ප්‍රාථමික ශ්‍රේණියේ තනතුරු 1ක් ද වශයෙන් එකතුව තනතුරු 319 ක් 2023 දෙසැම්බර් 31 දිනට පුරප්පාඩුව පැවතුණි. | ත්‍රෛමාසිකව හා මාසික වාර්තාවලින් නිලධාරී පුරප්පාඩු කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය වෙත දන්වා යැවීමට කටයුතු කර ඇත. ද්වීතියික මට්ටමේ පුරප්පාඩු වලින් බොහෝමයක් නව සංවර්ධන නිලධාරීන් හා ග්‍රාම නිලධාරීන්, කොට්ඨාශය වෙත ලබාදුන් පසු පිරවීමට හැකි බව වාර්තා කරමි. | අදාල අත්‍යවශ්‍ය පුරප්පාඩු පිරවීමට කටයුතු කළයුතු බව. |
| (ආ) | 2023 දෙසැම්බර් 31 දිනට සේවක සංඛ්‍යා විස්තර අනුව මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරීන් 5ක් ද ද්වීතියික හා ප්‍රාථමික ශ්‍රේණියේ සේවකයින් පිළිවෙලින් 103ක් | අධිසේවක පදනම මත බඳවා ගත් නිලධාරීන් හා සංවර්ධන නිලධාරී නව බඳවාගැනිම හේතුවෙන්, එම නිලධාරීන් ප්‍රාදේශීය ලේකම් | සේවා අවශ්‍යතාවය හඳුනාගෙන මුදල් රෙගුලාසි 71 ප්‍රකාරව අදාල තනතුරු අනුමත |

| | | | |
|---|---|---|---|
| | හා 01ක්ද ලෙස අනුමත සේවක සංඛ්‍යාව ඉක්මවා 109 ක් අතිරික්තව පැවතුණි. | කාර්යාලවලට හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලට යෙදවීම නිසා අනුමත සේවක සංඛ්‍යාව ඉක්මවා නිලධාරින් සේවයේ නියුතුව සිටී. | කරගත යුතු බව. |
| (ඇ) | 2001 අගෝස්තු 22 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/ 2001 ප්‍රකාරව සේවා කාලය වසර 5 ඉක්ම වූ නිලධාරීන් ස්ථාන මාරු සඳහා යටත්විය යුතු වුවද , දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13 තුල කාර්යාලගත සංවර්ධන නිලධාරීන් 59 ද , කළමනාකරණ සේවා නිලධාරීන් 53 ද, ක්ෂේත්‍රගත සංවර්ධන නිලධාරීන් 350 ක් ද ක්ෂේත්‍රගත ග්‍රාම නිලධාරීන් 5 ක් ද අනිකුත් නිලධාරීන් 21 ක් ද වසර 5 කට වැඩි සේවා කාලයක් එකම සේවා ස්ථානයේ සේවය කරමින් පැවතුණි . | සේවා ස්ථානයක අවුරුදු 05 ට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කරන ලද නිලධාරීන් සඳහා ස්ථාන මාරු ලබාදීම සුදුසු බව දන්වමි. | චක්‍රලේඛ විධිවිධාන වලට අනුකූලව ස්ථාන මාරුවීම් සිදුකළ යුතු බව. |